# සමාස නාම
## (Compound Nouns)

අන්‍යොන්‍ය සම්බන්ධය ඇති යුක්තාර්ථවත් ශබ්ද දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකතුවීමෙන් සෑදෙන නාම 'සමාස නාම' නමින් හැඳින්වේ. සංස්කෘතයේ 'සම්' (එකට/සමඟ) පූර්ව √අස් (දැමීම්) ධාතුව එක්වීමෙන් 'සමාස' යන පදය සෑදී ඇත. ඉන් අර්ථවත් වන්නේ 'එකට යොදන ලද' හෙවත් 'එකට කැටි කරන ලද' යන අර්ථයයි.

උදා :- යව්දිව්, බුදුගුණ, නිලුපුල්, සහසැස්, මව්පිය

සිදත් සඟරාවෙහි සමාස හඳුන්වා ඇත්තේ,

**'නේ සදන් සියො වැ එක සද අයුරක් වන සේ ගළපනු සමස් නම්'**

යනුවෙනි.

ඊට අනුව 'සමාස යනු නොයෙක් ශබ්ද එක් ව එක ශබ්දයක් වන ලෙස ගැළපීමයි.'

පාලි වියරණයෙහි සමාස හඳුන්වා ඇත්තේ,

**'සමාසො පද සංඛෙපො'**

සමාස යනු 'පද සංක්ෂේප හෙවත් කෙටි කිරීම' වශයෙනි.

සංස්කෘතයෙහි එය දක්වා ඇත්තේ

**'නාම්නාං සමාසො යුක්තාර්ථඃ'**

වශයෙන් 'නාමයන්ගේ යුක්තාර්ථය සමාස' යනුවෙනි.

සමාස මගින් සිදුවන්නේ කිසියම් පදයක් සංක්ෂිප්ත ව හා ක්‍රමවත් ව ව්‍යවහාරයෙහි යෙදවීමයි. මේ නිසා ව්‍යාකරණයෙහි ලා සමාසයට විශේෂ ස්ථානයක් හිමිවේ. සන්ධි කාර්යයෙහිදී ද සිදු වන්නේ පද කෙටි කිරීමකි. එසේ නම් සන්ධි හා සමාස අතර වෙනස හඳුනා ගැනීම ද මෙහි ලා වැදගත් වේ. සන්ධි කාර්ය සිදුවන්නේ වර්ණයන්ට අනුවයි. සමාස කාර්ය සිදුවන්නේ පදයන් අනුවයි.

කිසියම් සමාස පදයක ගැබ් ව පවත්නා අර්ථය පැහැදිලි වන සේ අධික පදයන් යොදා පද වෙන් කොට දක්වන වාක්‍යය 'සමාස විග්‍රහ වාක්‍යය' නමින් හැඳින්වේ.

උදා :- දහසක් ඇස් ඇත්තේ යමකුට ද හේ 'සහසැස්'

සමාස සාදා ගැනීමෙහි ප්‍රයෝජන කිහිපයකි. ඒවා නම් :-

1. ඒකපදත්ත්වය - පද කිහිපයක් එක් පදයක් බවට පත් කර ගැනීම
2. ඒකෝච්චාරණය - පද කිහිපයක් එක් පදයක් සේ උච්චාරණය කිරීම
3. ඒක විභක්තිකත්වය - එක විභක්තියක් බවට පත් කර ගැනීම
4. වාක්‍ය සංක්ෂිප්තභාවය - වාක්‍යයන්හි කෙටිබව
5. කර්තෘගේ ව්‍යක්තභාවය හා පාණ්ඩිත්‍යය දැක්වීම - සමාස බහුලත්වය යනු කතුවරයාගේ දක්ෂතාවයි.

# සමාස ප්‍රභේද

සමාස පිළිබඳ ව තවදුරටත් විග්‍රහයක යෙදෙන සිදත් සඟරා කතුවරයා,

'කියොලත එක අරුත සබඳ ව සදන් නතරුත්,
එවියූ සමස් විදි නම් එහි බේ දුන් පවස්මෝ'

(නොයෙක් අර්ථ ඇති ශබ්ද සම්බන්ධ වී එක අරුතක් කියන කල්හි එය සමාස නම් වේ. එහි ප්‍රභේද දුන් පවසමු.)

යනුවෙන් දක්වා ඇත.

සංස්කෘත ආදී මාතෘභාෂාගත මෙන් ම සිංහල භාෂාගත ද සමාස පිළිබඳ ප්‍රභේද කිහිපයකි.

❖ **විභක්ති ප්‍රත්‍ය ලොප් කිරීම හෝ නොකිරීම මත සමාස ප්‍රභේද දෙකකට බෙදේ.**

එනම් :-

1. ලෝප (සං. ලුප්ත) සමාසය
2. අලෝප (සං. අලුප්ත) සමාසය

## 1. ලෝප (ලුප්ත) සමාසය :-

විභක්ති ප්‍රත්‍ය ලොප් කොට සාදගනු ලබන සමාස ලෝප සමාස නම් වේ.

උදා :- බුදුන්ගේ ගුණ > බුදුගුණ

මව ද පියා ද > මව්පිය

සමාස අතරින් වැඩිපුර දක්නට ලැබෙන්නේ මෙලෙස විභක්ති ප්‍රත්‍ය ලොප් කොට සාදගන්නා සමාසයි.

## 2. අලෝප (අලුප්ත) සමාසය :-

විභක්ති ප්‍රත්‍ය ලොප් නොකොට පද එක් කිරීමෙන් සමාස සාදගැනීම මීට අයත් ය.

උදා :- මාසෙ පෝය > මාසෙපෝය

අතැ ඇඹුල > අතැඹුල

විභක්ති ප්‍රත්‍ය ලොප් නොකොට සාදගන්නා මෙබඳු සමාස ඇත්තේ විරල වශයෙනි.

## ❖ අර්ථ වශයෙන් සමාස සිව්වැදෑරුම් කොට දක්වා තිබේ.

**1. පූර්වපද ප්‍රධානය :-**

සමාස වන පද අතුරින් මුල් පදය ප්‍රධාන වීමයි. අව්‍ය සමස් මීට අයත් වේ.

උදා :- උපගුරු, අසුර, නිමල, යව්දිව්

**2. පරපද ප්‍රධානය :-**

පසු පදය ප්‍රධාන වීම මෙහි ලක්ෂණයයි. වෙසෙසුන් වෙසෙස් සමස් හා විබත් සමස් යටතේ සමාස කර ගන්නා පද මීට අයත් ය.

උදා :- නිලුපුල්, රතුමල, මුලසුන, තුන්ලොව, පන්සිල්, දසපෙරුම්

මව්ගුණ, ගම්බිත්තර, වනවැසි, බුදුසව්, සොරබිය

**3. උභයපද ප්‍රධානය :-**

සමාස වන පද දෙක හෝ කිහිපය ම හෝ එක සේ ප්‍රධානත්වයෙන් සැලකීම උභයපද ප්‍රධානයයි. මීට අයත් වන්නේ 'ද අරුත් සමස්' ය.

| | | |
|---|---|---|
| උදා :- | මව ද පියා ද | > මව්පිය |
| | අත් ද පාද ද | > අත්පා |
| | ඇත් ද අස් ද රිය ද පාබල ද | > ඇත්අස්රියපාබල |

**4. අන්‍යපද ප්‍රධානය :-**

සමාස වූ පදවලින් අන්‍යපදයක් ප්‍රධාන වන අන්අරුත් සමස් මීට අයත් වේ.

| | | |
|---|---|---|
| උදා :- | සහසක් ඇස් ඇත්තේ | > සහසැස් (ශක්‍රයා) |
| | දමුණු ඉඳුරන් ඇති | > දැමිඳුරු (මුනිවරයා) |

## ❖ පද ගැළපෙන විධි වශයෙන් සමාස පස්වැදෑරුම් ය.

**1. නාමයක් තවත් නාමයක් සමඟ ගැළපීම :-**

| | | |
|---|---|---|
| උදා :- | පොත් ද පත් ද | > පොත්පත් |
| | ගිහි ද පැවිදි ද | > ගිහිපැවිදි |

**2. විශේෂණ පදයක් සමග නාමපදයක් ගැළපීම :-**

උදා :- කළු ගොනා > කළුගොනා

උස් බිම > උස්බිම

**3. නාමයක් ධාතුවක් සමග ගැළපීම :-**

උදා :- දිවකර (දිවකරා), නිශාචර

**4. නිපාත පදයක් නාමයක් සමග ගැළපීම :-**

උදා :- යතවිදි, යතබල, යව්දිවි, නුනුවණ

**5. උපසර්ග පදයක් නාමයක් සමග ගැළපීම :-**

උදා :- අනුමෙවන්, අබිදම්, උපවන, අබිමන්, පරසිත්

### ❖ සිදත් සඟරාවෙහි දැක්වෙන පරිදි සමාස පස්වැදෑරුම් වේ.

'අවිය සමස්, විබත් සමස්, වෙසෙසුන් සමස්, අන් අරුත් සමස්, ද අරුත් සමස් යී සමස් පස් වැදෑරුම්'

එනම් :-

1. අවිය සමස් (අව්‍යයීභාව සමාස)
2. විබත් සමස් (තත්පුරුෂ සමාස)
3. වෙසෙසුන් සමස් (කර්මධාර, ද්විගු සමාස)
4. අන් අරුත් සමස් (බහුව්‍රීහි සමාස)
5. ද අරුත් සමස් (ද්වන්ද්ව සමාස)

## 1. අවිය සමස් (අව්‍යයීභාව සමාස)

අව්‍යය යනු නිපාත හා උපසර්ග සඳහා යෙදෙන පොදු නාමයයි. ඒ අනුව නිපාතයක් හෝ උපසර්ගයක් කිසියම් නාමයක මුලට එක්වීම් වශයෙන් සමාස වන විට අවිය සමස් නම් වේ. සිදතෙහි මෙය හඳුන්වා ඇත්තේ,

'පෙරකඩැ උසුරුවන යව් කුපන ඈ අවියන්

පරපද සබඳ ලද හොත් අවිය සමසැයි එවියු'

(පූර්වපදය වශයෙන් උච්චාරණය වන යව්, කු, ප, න ආදී අව්‍යයක් පරපදය හා සම්බන්ධ වුවහොත් එය අවිය සමස් නම් වේ).

නිපාත හෝ උපසර්ග වශයෙන් අව්‍යයක් ප්‍රධාන කොට ඇති සමාස අවිය හෙවත් අව්‍යයීභාව සමාස නම් වේ. මෙබඳු වූ අවිය සමස්හි ලක්‍ෂණ කිහිපයකි. එනම්ඃ

- නිපාතයක් හෝ උපසර්ගයක් හෝ පූර්වවීම
- උපසර්ග, නිපාතයන්ගේ අර්ථය ප්‍රධාන වීම
- සමාස පදය නපුංසක ලිංග ඒකවචනයෙන් තැබීම

**අවිය සමස්හි ප්‍රභේද සතරකි.**

1. '**යව්**' ආදී ගණය - මීට 'යව්, යත, අනු' යන අව්‍යය ශබ්ද අයත් වේ.
2. '**කු**' ආදී ගණය - මීට 'කු, දු, සු' යන අව්‍යය ශබ්ද අයත් වේ.
3. '**ප**' ආදී ගණය - මීට 'ප, උප' යන අව්‍යය ශබ්ද අයත් වේ.
4. '**න**' ආදී ගණය - මීට 'න, නො' යන අව්‍යය ශබ්ද අයත් වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| උදාඃ- | 1. | යව් දිව් | > | යව්දිව් | යව් කැලි | > | යව්කැලි |
| | | යත ලබ | > | යතලබ | යත විදි | > | යතවිදි |
| | | අනු බල | > | අනුබල | අනු හුරු | > | අනුහුරු |
| | 2. | කු පුරිස | > | කුපුරිස් | කු කවි | > | කුකවි |
| | | දු ලද | > | දුලද | දු ලබ | > | දුලබ |
| | | දු දන | > | දුදන | දු සිරිත් | > | දුසිරිත් |
| | | සු දන | > | සුදන | සු හද | > | සුහද |
| | | සු ගඳ | > | සුගඳ | සු මග | > | සුමග |
| | 3. | ප බ | > | පබ (ප්‍රභාව) | ප බල | > | පබල (ප්‍රබල) |
| | | සහ ජාත | > | සහජාත | උප වන | > | උපවන |
| | 4. | න සුර | > | අසුර | න කුසල් | > | අකුසල් |
| | | න ගුණ | > | අගුණ | න අදර | > | අනදර |
| | | න මිනිස් | > | නොමිනිස් | න හැකියාව | > | නොහැකියාව |
| | | න මද | > | නොමද | න හොඳ | > | නොහොඳ |

## 2. විබත් සමස් (තත්පුරුෂ සමාස)

ප්‍රථමා හා ආලපන (පෙර, අලප්) විභක්ති හැර කර්ම විභක්තියේ පටන් සම්බන්ධ විභක්ති දක්වා විභක්ති ප්‍රත්‍ය සහිත නාම පද ඊට පසුව ඇති නාමපදයක් හා එක් වීමෙන් සෑදෙන සමාසය විබත් සමස් නම් වේ.

සිදතෙහි එය මෙසේ සඳහන් වේ.

'පෙර පසු විබත් හැර - සෙසු සත් විබත් අත්පද

පරපද හා සමස් වත - එවිබත් සමස් නම් වේ.'

ඒ අනුව විබත් සමස් සත්වැදෑරුම් වේ.

**1. කම් විබත් සමස්** :-

උදා :- ගත කරනුයේ > ගත්කරු　　හිර වරණුයේ > හිරවරණ

මිය පල්නේ > මීපල්　　ගවයන් පල්නේ > ගවපල්

**2. කතු විබත් සමස්** :-

උදා :- පරා විසින් පුටුයේ > පරපුටු (කොවුලා)

බඹහු විසින් දෙන ලද්දේ > බඹදත් (සිවුරු)

දෙවියන් විසින් දෙන ලද්දේ > දෙව්දත් (බොජුන්)

**3. කරණ විබත් සමස්** :-

උදා :- අතින් කරන කම් > අත්කම්　　කිරෙන් පිසූ බත් > කිරිබත්

සැතින් කරන කම් > සැත්කම්　　දියෙන් හැනූ බත් > දියබත්

**4. සපදන් විබත් සමස්** :-

උදා :- මහල්ලන් සඳහා නිවාස > මහලුනිවාස

ගුරුන්ට දෙන පඬුරු > ගුරුපඬුරු

සිවුරු පිණිස පිරිනැමූ පිළි > සිවුරුපිළි

පින් පිණිස දෙන හාල් > පින්හාල්

**5. අවදි විබත් සමස් ඃ-**

| | | | | |
|---|---|---|---|---|
| උදා ඃ- | සොරුන්ගෙන් වන බිය > | සොරබිය | මුහුදෙන් හමන සුළං | > මුහුදුසුළං |
| | ඇසින් එන වහ | > ඇස්වහ | රජුගෙන් වන බිය | > රජබිය |

**6. සබඳ විබත් සමස් ඃ-**

| | | | | |
|---|---|---|---|---|
| උදා ඃ- | රජුගේ පිරිස් | > රජපිරිස් | මව්ගේ ගුණ | > මව්ගුණ |
| | බුදුන්ගේ සව් > | බුදුසව් | මිනිසාගේ ගුණ | > මිනිස්ගුණ |
| | හෙළයන්ගේ බස > | හෙළබස | ග්‍රහයන්ගේ බල | > ග්‍රහබල |

**7. අදර විබත් සමස් ඃ-**

| | | | | |
|---|---|---|---|---|
| උදා ඃ- | ගමෙහි වැසි | > ගම්වැසි | මුහුදෙහි දිය | > මුහුදුදිය |
| | සරාකල්හි සඳ | > සරාසඳ | දහම්හි සොඬ | > දහම්සොඬ |
| | දියෙහි සෙවෙල් > | දියසෙවෙල් | අකල්හි මරණ | > අකල්මරණ |

**8. අලුප්ත සමාසය ඃ-**

ඇතැම් විටෙක විභක්ති ප්‍රත්‍යය ලොප් නොකොට පූර්වාර්ධය පවත්නා අවස්ථා මීට අයත් ය. ආධාර විභක්තිය සහිත විබත් සමස් යෙදෙන එබඳු අවස්ථාවන්ට උදහරණ කිහිපයක් මෙලෙස දැක්විය හැකි ය.

| | | | |
|---|---|---|---|
| උදා ඃ- | අතැ ඇඹුල | > | අතැ'ඹුල |
| | මාසෙ පෝය | > | මාසෙපෝය |
| | අතැ වැසි | > | අතැවැසි |

## 3. වෙසෙසුන් සමස් (කර්මධාර, ද්විගු සමාස)

විශේෂණ - විශේෂ්‍ය වශයෙන් එක් අර්ථයක් සඳහා පවත්නා සමාන විභක්ති, වචන, ලිංග ඇති පද දෙකක් එක් පදයක් වන සේ ගැළපීම මෙහිදී සිදු වේ. කිසියම් නාමපදයක් ඊට සම්බන්ධ ව පවත්නා විශේෂණය සමඟ එක් වීම් වශයෙන් මෙම සමාසය සෑදේ.

සිදතෙහි එය මෙලෙස විස්තර වේ.

'විදෑ වතින් තොර සිය දෑ වතට සම වත,

වෙසෙසා සද සබඳ වත වෙසෙසුන් සමස් එ වියූ.'

විජාතීය වස්තුවෙන් වෙන් වූ ස්වජාතීය වස්තුවට සම වූ වස්තුව විශේෂණ කොට ශබ්ද සම්බන්ධය වන කල්හි එය විශේෂණ සමාස යැයි කියූහ.

මෙහි ප්‍රභේද පහකි.

එනම් :-

I. **විශේෂණ පූර්වපද සමාසය :-**
උදා :- සුදු මල > සුදුමල රතු හරකා > රතුහරකා නිල් උපුල් > නිලුපුල්

II. **විශේෂණ උත්තරපද සමාසය :-**
උදා :-ගුත්තිල ඇදුරු > ගුත්තිලඇදුරු රහල් හිමි > රහල්හිමි විදුර පඬි > විදුරපඬි

III. **උපමාන පූර්වපද සමාසය :-**
උදා :- සඳ එව් වත > සඳවත ගල් වැනි හිත > ගල්හිත

මල් වන් හිනාව > මල්හිනාව තිසර එව් තන > තිසර තන

IV. **උපමාන උත්තරපද සමාසය :-**
උදා :- සී වන් නර > නරසී කමල වැනි වත > වතකමල
උපුල් වැනි නෙත් > නෙතුපුල් කොමළ වන් ලිය > ලියකොමළ

V. **සංඛ්‍යා පූර්වපද සමාසය :-**

උදා :- පස් සිල් > පන්සිල් දස පැරුම් > දසපැරුම්

නව දෙර > නවදෙර තෙ සරණ > තෙසරණ/තිසරණ

## 4. අන් අරුත් සමස් (බහුව්‍රීහි සමාස)

වෙනස් වූ අර්ථ සහිත පද සමාස වීමෙන් පසුව එකී පදවල අර්ථයෙන් බැහැර වෙනත් අරුතක් සමාසයෙන් පැවැසේ නම් එය අන්‍යාර්ථ සමාසයයි.

සිදතෙහි එය මෙසේ සඳහන් වේ.

'කියොලත අන් අරුත් පදනත් අනේ වැ සියෝ

එසමස් අන් අරුත් නම් එහි බේ සත් විබතැ වේ.'

(වෙනස් අර්ථ ඇති නොයෙක් පද සමාස ව අන්‍ය වූ අර්ථයක් ප්‍රකාශ කෙරෙනුයේ එය අන් අරුත් සමස් වේ. එහි ප්‍රභේද විභක්ති සතෙහි වේ.)

❖ කර්ම විභක්තියෙහි පටන් ආධාර විභක්ති දක්වා විභක්ති හත අනුව මෙකී සමාසය සිදු වේ.

**1. කර්මාර්ථය :-**

උදා :- හස් එරුණේ යමකට ද ඒ > එරුණුහස් (විල)

හිරු බටුයේ යම් දෙසකට ද ඒ > බටහිර (බස්නාහිර දෙස)

**2. කර්තෘර්ථය :-**

උදා :- දිනය කරනුයේ යමෙකු විසින් ද ඒ > දිනකර

දමනය කරන ලද ඉඳුරන් යමකු විසින් ද ඒ > දැමිඳුරු (මුනි)

දල (ජලය) දෙනුයේ යමකු විසින් ද ඒ > දලද (වැහිවළාව)

**3. කරණාර්ථය :-**

උදා :- තුරු සුන් වූයේ යමෙකින් ද ඒ > සුන්තුරු (පොරොව)

පන් සිඳෙනුයේ යමකින් ද ඒ > පන්හිඳ

බත් සුන් වූයේ යමකින් ද ඒ > සුන්බත් (යුද්ධය)

**4. සම්ප්‍රදානාර්ථය :-**

උදා :- දෙන ලද වත් යමෙකුට ද ඒ > දුන්වත් (බමුණු)

**5. අවධි අර්ථය :-**

උදා :- හිරු නැගෙන්නේ යම් දෙසකින් ද ඒ > නැගෙනහිර (පෙරදිග)

ගිලිහුණු ගොනගුල් යමකින් ද ඒ > ගුලුගොනගුල් (ගස)

**6. සම්බන්ධාර්ථය :-**

උදා :- පස් ඇස් ඇතියේ යමකුගේ ද ඒ > පසැස් (බුදුරජ)

කර (රශ්මි) සහස් ඇත්තේ යමකගේ ද ඒ > සහසකර (හිරු)

සහස් ඇස් ඇත්තේ යමෙකුගේ ද ඒ > සහසැස් (ශක්‍රයා)

**7. ආධාරාර්ථය :-**

උදා :- මත් වූ නොයෙක් ඇතුන් යම් තැනෙක ද ඒ > මත්නේගජ (වනය)

අකාරය ආදි කොට පද ඇත්තේ යමෙක්හි ද ඒ > අකාරාදිය (ශබ්දකෝෂය)

- විභක්ති ප්‍රභේදයට අමතර ව අන් අරුත් සමස් තවත් ලෙසකින් ප්‍රභේදගත වේ.

එනම් :-

**1. තද්ගුණ අන්‍යාර්ථ සමාසය :-**

සමාස වන පදවලින් කියැවෙන යම් ලක්ෂණයක් සමාසයෙන් නැගෙන අන්‍යාර්ථයේ ද වේ නම් ඒ තද්ගුණ අන්‍යාර්ථ සමාසයයි.

උදා :- ලඹ සවන් > ලඹසවන් (ක්ෂත්‍රිය)

ති නෙත් > තිනෙත් (ඊශ්වර)

පන් සිළු > පන්සිළු (දිව්‍ය ගාන්ධර්වයා)

**2. අතද්ගුණ අන්‍යාර්ථ සමාසය :-**

සමාස වන පදවලින් කියැවෙන යම් ලක්ෂණයක් සමාසයෙන් නැගෙන අන්‍යාර්ථයේ පදවලින් දක්නට නොලැබේ නම් එය අතද්ගුණ සමාසයයි.

උදා :- ඉකුත් සයුරු > ඉකුතසයුරු (නැව්යා)

සුන් තුරු > සුන්තුරු (පොරොව)

## 5. ද අරුත් සමස් (ද්වන්ද්ව සමාස)

සමුච්චයාර්ථයෙහි යෙදෙන 'ද' නිපාතයෙන් සම්බන්ධ කළ හැකි එක ම ක්‍රියාව අපේක්ෂා කරන ඒකවිභක්තික නාමපද දෙකක් හෝ කිහිපයක් හෝ 'ද' නිපාත ලොප් කොට එකපදයක් වන සේ ගැළපීම මෙහිදී සිදු වේ.

උදා :- මව් ද පිය ද > මව්පිය

අත් ද පා ද > අත්පා

දෙව් ද බඹ ද > දෙව්බඹ

ගම් ද බිම් ද > ගම්බිම්

බඹ ද සුර ද නර ද > බඹසුරනර

සිදතෙහි ද අරුත් සමස් මෙසේ හඳුන්වා තිබේ.

'අඟ පාමොක් වත සමුදු මැ හෝ එපදන්,

ද අරුතැ වූ පද සමාමි අ අරුත් සමස් නම් වේ.

(ඒ සමාස වන පදයන්ගේ අංග ප්‍රමුඛ වන කල්හි හෝ සමුදයාර්ථයක් ප්‍රමුඛ වන කල්හි හෝ 'ද' කාරාර්ථයෙහි වූ පද සමාගමය 'ද කාරාර්ථ සමාස නම් වේ.)

සිදතෙහි ඉහත විග්‍රහයට අනුව ද අරුත් සමස් හි ප්‍රභේද දෙකකි.

එනම් :-

**1. අවයව (අංග) ප්‍රධානත්‍වය :-**

'ද' කාරාර්ථයෙන් සමාසයෙන් එකට කැටි වූ ඇතැම් පද වෙන් වෙන් වශයෙන් ප්‍රධානත්‍වය හිමිකර ගැනීම මීට අයත් වේ.

උදා :- මව් ද පිය ද > මව්පිය

සැරියුත් ද මුගලන් ද > සැරියුත් මුගලන්

බඹ ද සුර ද නර ද > බඹසුරනර

මෙහි දී සෑම පදයක් ම එක සේ වැදගත් වන අතර එක සේ ප්‍රධානත්වය හිමි කර ගනී. මෙම ලක්‍ෂණය අවයව හෙවත් අංග ප්‍රධානත්වය නමින් හැඳින්වේ.

**2. සමුදය ප්‍රධානත්‍වය :-**

මෙහි ස්වභාවය වන්නේ එක් එක් අවයවයක් ප්‍රධානත්වය හිමිකර ගැනීම වෙනුවට පද කිහිපය ම සමූහය වශයෙන් ගෙන සමුදයාර්ථයට ප්‍රධානත්වය හිමිකර ගැනීමයි.

උදා :- අත් ද පා ද > අත්පා

ඇඳ ද ඇතිරිලි ද > ඇඳඇතිරිලි

රන් ද රිදී ද මුතු ද මැණික් ද > රන්රිදීමුතුමැණික්

❖ දකාරාර්ථ සමාසගත ලක්‍ෂණ කිහිපයක් :-

**1. අල්පස්වර වචන මුලින් ද බහුස්වර වචන ඉන්පසුව ද යෙදීම:**

උදා :- ගිහි ද පැවිදි ද > ගිහිපැවිදි

ඇඳ ද ඇතිරිලි ද > ඇඳඇතිරිලි

දෙව් ද මිනිස් ද > දෙව්මිනිස්

**2. අතිශය පූජ්‍ය පදය මුලින් යෙදීම:**

උදා :- සැරියුත් ද මුගලන් ද > සැරියුත්මුගලන්

බුදු ද පසේබුදු ද මහරහත් ද > බුදුපසේබුදුමහරහත්

**3. ස්ත්‍රී ලිංග පදය මුලින් යෙදීම:**

උදා :- ස්ත්‍රී ද පුරුෂ ද > ස්ත්‍රීපුරුෂ

ගැහැනු ද පිරිමි ද > ගැහැනුපිරිමි

මව් ද පිය ද > මව්පිය

නැන්ද ද මාමා ද > නැන්දමාමා

**4. ස්වරාධික පදය මුලින් යෙදීම:**

උදා :- ආනන්ද ද නන්ද ද > ආනන්දනන්ද

❖ සමාසයන්ගේ ලිංග භේදය :-

| | | |
|---|---|---|
| **1. අවිය සමස්** | - | **නපුංසක ලිංග** |
| **2. විබත් සමස්** | - | **පරපදයාගේ ලිංග** |
| **3. වෙසෙසුන්** | - | **සමස් පරපදයාගේ ලිංග** |
| **4. අන්අරුත් සමස්** | - | **අන්‍ය පදයාගේ ලිංග** |
| **5. ද අරුත් සමස්** | - | **පරපදයාගේ ලිංග** |